




# අභ්‍යවකාශ මිනිසුන්

හඳට ගිය ගමන

විද්‍යා ප්‍රබන්ධය





1



කාන්තන්ගර ප්‍රකාශන

## ① අමුතු සංඥාව




මෙම වසර ක්‍රි.ව.4521 ය. පීටර් සහ ජැක් යනු විද්‍යාඥයන් දෙදෙනෙකි. ඔවුහු විසින් බොහෝ දේ සොයා ගන්නා ලදී. පාවෙන බයිසිකලය, පාවෙන කාරය සහ පියාඹන ඇඳුම වැනි බොහෝ දේ සොයා ගන්නා ලදී. දිනක් ඔවුහු තම කොම්පුටරයෙන් සංඥා බල බල සිටින විට, එකවිට ම "මේක ඇහෙනවද... මම මගේ යානාවේ සිටින්නේ... මම සූර්යයාට පසුපස වී සිටින්නේ... ඔක්සිජන් ප්‍රමාණය 5% යි තිබෙන්නේ... මම සිටින්නේ චන්ද්‍රයාගේ නොපෙනෙන පැත්තෙහි ය." කියා එය අවසන් වුනෝ ය. ඔවුන් දෙදෙනා තම තමන්ගේ මුහුණුවල් දෙස බලා සිටියෝ ය.

ය. ඔවුහු අනෙක් දවසේ වැඩ කරන අභාසවකාශ මධ්‍යස්ථානයට ගොස් කාර්ය මණ්ඩලයට පැවසුවේ ය. ඔවුහු කිවුවේ ඔවුන් යවන ලද කිසිම යානයකට හසු වී නොතිබුණ ලෙසයි. ඔවුහු කණගාටුවෙන් ප්‍රකාශ කළෝ ය. ඔවුහු පැවසුවේ ලබන වසරේ දී එය පිළිබඳව සොයන බව ය. එය සඳහා පීටර් සහ ජැක් තෝරා ගන්නා ලදී.




## ② සොයන සංඥාව




නොදැවී කාලය ගත විය. ඔවුන්ගේ පර්යේෂණවලට ලකුණු ලබා සමත් විය. ඔවුහු ඔවුන් දෙදෙනාගේ ඇඳුම් ලැස්ති කර ගත්තෝ ය. ඔවුන්ගේ ඔක්සිජන් සිලින්ඩර 2 ක ලැස්ති කර ගත්තෝ ය. ඔවුහු රොකට් එකට නැග්ගේ ය. පාලන මැදිරියෙන් ගණන් කළෝ ය. "10...9...8...7...6...5...4...3 එන්ජින් දැල්වෙනවා 2...1...0... රොකට්ටය උඩට ගියා." කියමින් අත්පොළසන් ගැසුවේ ය. ඔවුහු අභ්‍යවකාශයට පිවිසියේ ය. ඔවුන්ගේ යානාව පෘථිවිය වටා දින 3 ක් කැරකුණෝය. ඔවුන් අන්තිමට පෘථිවියෙන්


ඈතට ගියේ ය. ඔවුන් කෙලින් ම ගියේ හඳ දෙසට ඉලක්ක කරමිනි. ඔවුන් මෙම අභිරහස කුමක්දැයි හඳ බලා පිටත්ව ගියෝ ය.

## ③ 4 වෙනි දවස





දැන් ඔවුන් හඳට 219,415km ඈතින් සිටින්නේ. හැබැයි ඔවුන් දෙදෙනා විතරක් නොවී ය. තව එක පුද්ගලයෙකු විය. ඔහු රොබෝවෙක්. ඔහුගේ නම 'Brave' (බ්රේව්). බ්රේව් තමයි යානය පාලනය කරන්නේ ජැක් සහ පීටර් නිදා ගත් විට ය. ඔහු ජැක් සහ පීටර්ට ඉතා හිතවත් ය. දවසක් ඔහු යානයේ ඇන්ටනාව කැඩී ඇති බව දැනුම් දුනි. එකවිට ම පෘථිවිය සමඟ සම්බන්ධතාවය නැතිවුණි. හොඳ වෙලාවට ඔවුන්ට අමතර ඇන්ටනාවක් තිබුණි. පීටර් මෙවැනි දේවල් කිරීමට බිය යි. එම නිසා එම වැඩේ ජැක්ට භාර දුනි. ඔහු ඇන්ටනාව අභ්‍යවකාශයට විසි කර යානයේ වූ තවත් 'මැරයින්සීස්' නමින් හඳුන්වන යානයෙන් ඔහු ඇන්ටනාව අල්ලා ගත්තේ ය. ඉන් පසු ඔහු ලොකු යානය ළඟට ගොස් පරණ ඇන්ටනාව ගලවා අලුත් ඇන්ටනාව සවි කළේ ය. ඔහු ආපසු එන විට යානය පාලනය කිරීමට නොහැකි විය. ලොකු යානයෙන් ඈතට විසි විනි. ලොකු යානයේ [illegible] කැබිම අතකින් අර ගත්තේ ය. පීටර් ලොකු යානයට සම්බන්ධ කර ජැක්ගේ ජීවිතය බේරා ගැනිනි. ආයෙමත් පෘථිවිය සමඟ සම්බන්ධය නැගුනි.

## ④ 5 වෙනි දවස




"හලෝ... අපි කතා කරන්නේ ලොකු යානයෙන්, දැන් අපි සිටින්නේ හඳට 45,000km ඈතින්" පීටර් ය. කියමින් පෘථිවියට සංඥාවක් යැවුවේ පීටර් ය. හඳට යනු ළඟම වන විට හඳේ නොපෙනෙන පැත්තට යනු ඇත. එවිට යානයේ කටයුතු සාමාන්‍ය ආකාරයෙන් කර ගෙන ගියේ ය. එකවිට ම යානය වැසුණි. බ්රේව් බැටරි මෝඩයෙන් විදුලිය ලබා ගැනුනි. බ්රේව් සූර්ය පැනලයේ වයර් කැඩී ඇත කියා කිව්වේ ය. ජැක් 'මැරයින්සීස්' නම් වූ අනෙක් කුඩා යානයෙන් ගියේ ය. ඔහු කාව පාට (-) වයරය කැඩී ඇති බව පෙනී ගියේ ය. ඔහු එය එතේට විශේෂිත වූ සෙලෝටේපයකින් වැසුවේ ය. නැවත සූර්යකෝෂ වැඩ කිරීමට පටන් ගැනිනි.


## 5 අද්භූත දැක්ම




දැන් ඔවුන් සිටින්නේ 45,000km ක් උඩිනි. කොමෙ-න් කොමෙන් ඔවුන් හඳේ නොපෙනෙන පැත්තට ළඟා විය. ඔවුන්ට දැක ගැනීමට හැකි වුයේ යකඩ කැබලි විතරය. ඔවුන් කුඩා යානයක් හඳ මත පතිත වී ඇති බව දැක්කෝ ය. ඔවුන් යානයේ තිබූ සුපිරි දුරේක්ෂයකින් තවත් ළිං කර බැලුවෝ ය. ඔවුහු මිනිසෙකු සිටින බව දැක්කෝ ය. තවත් පුදුම වුවෝ ය. ඔහු හැබැයි මැරී ඇත කියා තහවුරු කිරීමට ජැක්ව සඳ මතට යැවුවේ ය. ජැක් 'Moon 01A' කියන යානයෙන් ගියේ ය.




## 6 පතිත වීම



ජැක් එන්ජිමේ ශක්තිය කොමෙන් කොමෙන් වැඩි කාලේ ය. ඔහු සෙමෙන් ඉදිරියට ගියේ ය. ඔහුගේ යානයට පතිත වීමට සුදුසු තැනක් නොතිබුණ හෙයින් ඔහු ඉදිරියට ගියේ ය. ඔහුගේ යානයේ ඉන්ධන වේගයෙන් ගෙවිනි. ඔහු තැනක් සොයාගත්තේ ය. ඔහු සෙමෙන් සෙමෙන් සඳ මත පතිත වුණේ ය. පෘථිවියේ මිනිස්සු අත්පොළසන් දුන්නෝ ය. ජැක් ඔහුගේ අභ්‍යවකා-ශ ඇඳුම ලෑස්ති කර ගත්තේ ය. ඔහු සඳ මත පා තැබුවේ ය. යානයේ තිබූ කාරය එළියට අරගෙන කැඩුණු යානය වෙත ගියේ ය. ඔහු එහි සිටි මිනිසා පරීක්ෂා කිරීම.

## ⑦ භූතයා




ඔහු හදවත් ස්කෑනරය අතට ගත්තේ ය. ජැක්
මින්සාගේ හදවත ළඟට ලං කළේ ය. "ඔහු තාම-
-ත් ජීවත් වෙනවා" කියමින් ජැක් කෑගැසුවේ ය.
"ඔහුට සිහිය නැති වී තිබෙන්නේ, ඔහු නම් භූතයෙ-
-ක් යැයි" සතුටින් ජැක් කෑගැසුවේ ය. එහි තිබූ
පරිගණකය තාම වැඩ ය. ජැක් එය බැලුවේ ය.
එහි ශබ්ද පණිවුඩයක් තිබුණේ ය. එහි කොම්පුටර-
-යේ හසු වූ තරංගය මේකොඩි තිබුණේ ය. ඔහු
පුදුම වුණේ ය. ජැක් මින්සා රැගෙන ආපසු ගියේය



## ⑧ වායුගෝලයට ඇතුළු වීම




ඔවුහු මින්සා රැගෙන ලොකුයානයට පැමිණි-
-යේ ය. ඔවුහු සිහිගන්නවන්න සියලු දේ කළේය.
හැබැයි ඒ කිසිවක් හරි ගියේ නැත. "ඔහු පෘථිවියේ
උෂ්ණත්වයට ඇහැරෙයි." පීටර් කීවේ ය. "ඔව්" ජැක්
කීවේ ය. ඔවුහු පෘථිවි වායුගෝලයට කොමෙන්
කොමෙන් ළඟා වුණි. ඔවුහු යානය සමඟ පැසිෆික්
සාගරයට බැස්සේ ය. මින්සාට සිහිය ආවේ ය.
ඔවුහු රෝහලට රැගෙන ගියෝ ය. ඔවුහු ඉන්පසු සතුටින්
ජීවත් වුණෝ ය.

Coming Soon...

# අභ්‍යවකාශ මිනිසුන්

2

බුධට ගිය ගමන